www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# චීන කොමියුනිස්ට් පක්ෂ සම්මේලනය: පෞද්ගලික ධනය හා වෙළඳපොල සාර්ථකත්වය උත්සව ශ්‍රීයෙන් සමරයි

## China's Communist Party congress: a celebration of private wealth and market success

**ජෝන් චාන් විසිනි**
**2007 ඔක්තෝබර් 26**

සතියක් පුරා පැවති චීන කොමියුනිස්ට් පක්ෂයේ (සීසීපී) 17 වැනි ජාතික සම්මේලනය ඔක්තෝබර් 21වැනි දා අවසන් වූයේ එම තන්ත්‍රය යැපෙන වෙළඳපොලට පක්ෂපාතී වූ ආර්ථික න්‍යාය පත්‍රය හෝ පොලිස් රාජ්‍ය පියවර සැලකිය යුතු වෙනසකට ලක් කිරීමකින් තොරව ය. නියෝජිතවරු සිය රාජකාරිය ඉටු කරමින් නිල ප්‍රතිපත්තිවලට අනුමැතිය දුන් අතර කිසිදු ප්‍රතිවිරෝධයකින් හෝ විරුද්ධත්වය ප්‍රකාශ කිරීමකින් තොරව ඇහිඳගන්නා ලද නව නායකත්වයත් ස්ථාපිත කලහ.

නිල පුවත් ආයතනය වන සින්හුවා ඒජන්සියට අනුව ජනාධිපති හූ ජින්ටාවෝ සිය ආරම්භක දේශනය තුල "ප්‍රජාතන්ත්‍රවාදය" යන වදන 60 වරකට වඩා යොදාගත්තේ ය. එ නමුදු, නිලධාරිවාදී වූ සැලසුම් කොට රඟ දක්වන ලද්දාවූ ද මෙම සම්මේලනය සමාජවාදයට හෝ කොමියුනිස්ට්වාදයට නෑකම් කීම කෙසේ වුව ද, කිසිදු අන්දමකින් ප්‍රජාතන්ත්‍රවාදී එකකැයි විස්තර කිරීම විකාර රූපීය. එහි දිගහැරුන ක්‍රියාදාමය තුල චීනයෙහි බිලියන 1.3ක ජනතාවට කිසිදු හඬක් ඇති කල නොහැකි විය.

2200කට අධික වූ නියෝජිත පිරිස මිලියන 73.4ක් වන සීසීපීයේ සාමාජිකයින් විසින් සෘජුව ම ඡන්දයකින් තෝරා පත් කර ගන්නා ලද අයවලුන් නොව, නොයෙක් කලාපවල නිලධාරි යන්ත්‍රය මගින් තෝරාගන්නා ලද අයවලුන් ය. පසුගිය සති අන්තයේ සාමාජිකයින් 204 දෙනෙකුගෙන් සමන්විත වඩාත් කුඩා මධ්‍යම කාරක සභාව මෙම නියෝජිතවරු ස්ථිර කලහ. එම සභාව පිලිවෙලින් සාමාජිකයින් 25 දෙනෙකුගෙන් සැදුම්ලත් පොලිට් බියුරෝව ද බලගතු 9 දෙනෙකුගෙන් සමන්විත පොලිට් බියුරෝවේ ස්ථාවර කමිටුව ද ස්ථාපනය කලේ ය. මධ්‍යම කාරක සභිකයින්ගෙන් අඩකට වැඩි කොටසක් ඊනියා කොමියුනිස්ට් තරුන සංගමයේ වැඩි වශයෙන් හූගේ අනුගාමිකයින් ගෙන් ආදේශ කෙරින.

දශක තුනක් තුල ක්‍රියාත්මක කරන ලද "වෙළඳපොල ප්‍රතිසංස්කරනයෙන්" පසුව, සමකාලීන චීනයෙහි ධනවත් හා වරප්‍රසාද ලත් සමාජ ස්තරයන්හි - එනම්, රාජ්‍යයේ හා පක්ෂයේ නිලධාරින්, මිලිටරියේ ඉහල ම නිලධාරින්, පෞද්ගලින ව්‍යාපාරිකයින්, පොහොසත් වෘත්තිකයින් හා රටෙහි ජනවාර්ගික සුලුතරය අතර ප්‍රභූවරුන් - නියෝජිතයින්ගේ පාලක හවුලක් ලෙස සීසීපීය ඉස්මතු වී ඇත. මොවුන් අතර විවිධ තරගකාරී අවශ්‍යතාවන් තිබුන ද වේගයෙන් වර්ධනය වන කම්කරු පන්තිය සම්බන්ධයෙන් මේ සියලු කොටස්වලට ඇත්තේ සමාන විරුද්ධත්වයක් වන අතර අධිපතිධාරී ක්‍රම උපයෝගී කරගැනීම තුලින් බලය තම ග්‍රහනයෙහි තබා ගෙන සිටිති.

හූගේ එකම "දේශපාලන ප්‍රතිසංස්කරනය" වූයේ පක්ෂ අභ්‍යන්තරයේ ඡන්ද විමසීම්වල දී වැඩි අපේක්ෂකයින් සංඛ්‍යාවකට ඉදිරිපත් වීමට ඉඩ සැලසීම යි. නිදසුනක් වශයෙන්, මධ්‍යම කාරක සභාවට නම් කරන ලද අය අතුරින් කලින් සියයට 5ක් ඉවත් කිරීමට සාපේක්ෂව මෙවර සියයට 8ක් ඉවත් කෙරින මෙයින් ඇඟවෙන්නේ නිලධාරිවාදී ක්‍රම උපයෝගි කර ගනිමින් සකස්කරන ලද අපේක්ෂකයින්ගේ ලැයිස්තු කලින් සකසන ලැයිස්තුවලට වඩා මඳ වශයෙන් දිගු වීම පමනි. ඉහල පෙලේ නායකයින් විශ්‍රාම ගන්වන වයස අවුරුදු 68ක් ලෙසට ඔහු විධිමත් කලේය. - මෙහි අරමුන එක් අතකින් බලය ස්ථාවර ලෙස පරිවර්තනය වන බවට වෙළඳපොලවලට යලි සහතික වීම වූ අතර අනික් අතට සිය වැඩි වශයෙන් කල්ලිවාදී ප්‍රතිවාදීන්ට ඉවත්වීමට බල කිරීම විය.

විශේෂයෙන් ම බීජිංහි කිසිදු විරෝධතාවක් වලක්වනු වස්, කොන්ග්‍රසය පැවැත්වීමට පෙරාතුව දේශපාලන විරුද්ධවාදීන් හා ක්‍රියාකාරීන් නිහඬ කිරීමට එලන ලද දැවැන්ත පොලිස් දැල සම්බන්ධයෙන් රජය සතු මාධ්‍ය කිසිදු සඳහනක් නොකලහ. උපයෝගීකරුවන්ට පක්ෂයේ ප්‍රධාන කමිටුවල සංයුතිය සාකච්ඡා කිරීම තහනම් කිරීම තුලින් රටෙහි

අන්තර්ජාල පොලීසිය වාරන නිර්නායක දැඩි කලේ ය. හූ පසුගිය සඳුදා මාධ්‍ය හමුවේ පෙනී සිටියේ මහත් හරසර මධ්‍යයේ වන අතර, ඔහු මහත් විශ්වාසයකින් යුතුව නිශ්චිත ධුරාවලි අනුපිලිවෙලට නව පොලිට් බියුරෝවේ ස්ථාවර කමිටුවේ පෙරමුන ගත්තේ ය. මෙම උත්තරීතර තීරන ගන්නා මුඩුල්ලෙහි බලය හූ විසින් සුරක්ෂිත කර ගෙන තිබුනි. පක්ෂ ලේකම් වශයෙන් ද බලගතු මධ්‍යම මිලිටේරි කොමිෂන් සභාවේ සභාපති වශයෙන් ද ඔහු "යලි තෝරා පත් කර ගැනුනි."

2000 වසරේ දී කලින් පැවති සම්මේලනයෙහිදී හූ විසින් පාලනය භාරගන්නා අවස්ථාවෙහි පොලිට්බියුරෝවේ ස්ථාවර කමිටුවේ ආධිපත්‍ය ෂැංහයි මත පදනම් වූ පක්ෂයේ සිය සහායකයින් සතුව තබා ගැනීමට ඉවත්ව ගිය සභාපති ජියැං සෙමින් වගබලාගත්තේ ය. දැන් එම කල්ලියේ ප්‍රධාන පුද්ගලයින් තිදෙනෙකුට සිය තනතුරුවලින් ඉල්ලා අස්වීමට බලකෙරී ඇත. හේතුව නිල වශයෙන් දක්වා ඇත්තේ වයස්ගතවීම යඃ මේ තිදෙනා නම්, උපසභාපති සෙං ක්වින්හොං, රාජ්‍ය ආරක්ෂක ප්‍රධානී ලුඕ ගැං හා පක්ෂ විනය භාරව කටයුතු කල වූ ගුවාන්සෙං ය. හුවැං ජු මේ වසරේ මුලදී මරනයට පත් විය. ජියා ක්වින්ලින් හා ලී චැංචුන් ස්ථාවර කමිටු සාමාජිකයින් වශයෙන් තව දුරටත් රඳවා ගන්නා ලදී. ජියා ට එරෙහිව දූෂන චෝදනා එල්ල වී ඇත. ලී පක්ෂයේ ජනප්‍රිය නොවන ප්‍රචාරක කටයුතු පිලිබඳ ප්‍රධානියා වේ.

ජියැංගේ බලපෑමට යටින් වල කැපීමට හූ ක්‍රියා කර ඇත. සම්මේලනයට දින කිහිපයකට පෙරාතුව රැස්වූ ඉහල ම පෙලේ නායකත්ව කමිටුවක් ෂැංහයි පක්ෂ ප්‍රධානී චෙන් ලියැංයූ විධිමත්ව සිය තනතුරින් පහ කරන්නට යෙදුනි. දූෂන චෝදනාවලට මුහුන දීමට ඔහු රජයේ පැමිනිලි මෙහෙයවන්නා වෙත භාර කෙරුනි. ආර්ථික වර්ධනයේ වේගය පිලිබඳව හූ, ජියැංගේ කල්ලිය සමග තියුනු මත ගැටුමකට එලඹ ඇත. සමපේක්ෂනමය ආයෝජකයින් හසුරුවීමට හූ විසින් ක්‍රියාත්මක කරන ලද ප්‍රතිපත්තිවලට ව්‍යාපාරික ක්ෂේත්‍රයේ හා ප්‍රාදේශික පක්ෂ ප්‍රධානීන්ගේ බලගතු කොටසක් විරෝධය පා ඇත. චෙන් යටතේ ෂැංහයි නගරය මෙහි පෙරමුන ගෙන ඇත.

අලුතින් පත් කෙරුනු හා වඩාත් තරුන වියෙහි පසුවන ස්ථාවර කමිටු සාමාජිකයන් වන්නේ වර්තමාන ෂැංහයි පක්ෂ ලේකම්, සී ජින්පිං, ඊසානදිග ලියාඕනිං පලාතේ සීසීපීයේ ප්‍රධානි, ලී කෙක්වියාං, මහජන ආරක්ෂක ඇමති, සූ යොංකැං හා පක්ෂ සංවිධායක, හී ගෝක්වියැං යන අයවලුන් ය. 2012 වසරේ හූගේ වාරය අවසන දී ඔහුගේ අනුප්‍රාප්තිකයන් වනු ඇතැයි වඩාත්ම සැලකෙනුයේ 50 වියෙහි මුල් ගනන්වල පසුවන සී හා ලී ය. විශේෂයෙන්, කොමියුනිස්ට් තරුන සංගමයට අයත් ලී, හූ ගේ සමීප අනුගාමිකයෙකු ලෙස සැලකේ. ස්ථාවර කමිටුවේ ඉතිරි තිදෙනා වන්නේ හූ, ඔහුගේ සමීප සගයෙකු වන අගමැති වෙන් ජියාබාවෝ හා ජාතික මහජන සම්මේලනයේ සභාපති, වූ බංගුවෝ ය.

ලී තම අනුප්‍රාප්තිකයා වශයෙන් පත් කිරීමටත් ස්ථාවර කමිටු සාමාජිකත්වය නවය සිට හත දක්වා අඩු කිරීමටත හූ උත්සාහ දරමින් සිටි බවටත් එම උත්සාහයන් දෙක ම අසාර්ථක වූ බවටත් ඔක්තෝබර් 22 වැනි දින *නිව් යෝක් ටයිම්ස්* පුවත්පත වාර්තා කලේය. සී ජින්පිංගේ හදිසි ඉස්මතු වීම පෙන්නුම් කරනුයේ කල්ලිවාදී බල අරගලය තුල හූ ට සම්මුතියකට එලඹීමට බලකෙරී ඇති බවයි. සී චූකලි පක්ෂයේ "කුමාරයෙකි" - එනම් සීසීපීයේ පැරනි සාමාජිකයෙකු වන සී සොන්සුන්ගේ පුත්‍රයා යි.

සී සහ ලී යන දෙදෙනාටම ඇත්තේ හූ ට තිබෙන ගති ලක්ෂනය. ඔවුහු වෘත්තීමය තාක්ෂන විශේෂඥයන් වෙති. 1949 වසරේ විප්ලවයට ඔවුන්ගේ ඍජු සම්බන්ධයක් නොතිබුනි. 1960 ගනන්වල සිදුවූ විනාශකාරී සංස්කෘතික විප්ලව කාල වකවානුව තුල හූ රතු ආරක්ෂකයන්ගේ සාමාජිකයෙකු විය. කොමියුනිස්ට් තරුන සංගමයේ සාමාන්‍ය තත්වයෙන් ක්‍රමයෙන් ඉහලට නැග්ග ඔහු ගැංසු හා ටිබෙට්හි පක්ෂ ප්‍රධානියා බවට පත්විය. සී හා ලී පශ්චාත් මාවෝ පරම්පරාවට අයත් වෙති. ඔවුන්ගේ මුල් ප්‍රගමනය පසුගිය විසිපස් වසර තුල "වෙලඳපොල ප්‍රතිසංස්කරනයන්" හා එකට වෙලී ඇත.

මේ නව දේශපාලනමය "තාරකා" දෙකට ජනප්‍රියත්වයක් නොමැත. පාපැදියකින් බීජිං නුවර සංචාරයක යෙදෙන රෙදිපිලි අලෙවිකරන්නෙකු වන සායි හොංවේ ඔස්ට්‍රේලියන් පුවත්පතට මෙසේ පැවසීයඃ "ස්ථාර කමිටුවේ පෙනෙන්නට තිබෙන මුහුනු ගැන මගේ වැඩි සැලකිල්ලක් නැත. ඔවුන් සාමාන්‍ය ජනතාවට වාසි සලසනු ඇතැයි - අපට ප්‍රායෝගික යමක් කරනු ඇතැයි - අපි අපේක්ෂා කරමු." සේවය අත් හිටවන ලද කම්කරුවෙකු වන ලී සියාඕ හොං මෙසේ පැවසී යඃ "නව නායකයින් සේවා වියුක්තිය ගැන යමක් කරනු ඇතැයි අපි අපේක්ෂා කරමු. වයස අවුරුදු 40ට වැඩි අප වැනි අයට රැකියාවක් සොයාගැනීම උගහටය. මිල ගනන් තියුනු ලෙස ඉහල නගී."

එසේ වුව ද ලී සහ සී භූගෝලීය මූල්‍යමය කවයන් අතර ප්‍රසිද්ධියක් උසුලන අය වෙති. එක්සත් ජනපද භාන්ඩාගාර ලේකම් හෙන්රි පෝල්සන්, "ගෝල් ඉරෙහි සීමාව ඉක්මවා ගොස් යමක් කල හැකි අන්දමේ පුද්ගලයෙකැ"යි සී වර්ණනා කලේය. ව්‍යාපාරික ගනුදෙනු සම්බන්ධයෙන් සී දැන හඳුනාගන්නා විට පෝල්සන්, ගෝල්ඩ්මන් සැච්ස් සමාගමේ ප්‍රධානියා විය. සිටි ග්‍රෑප් සමාගමේ ජ්‍යෙෂ්ට උපදේශකයෙකු වන රොබර් කුන් බ්ලුම්බර්ග්ට මෙසේ පැවසී යඃ "ලී හ සී යන දෙදෙනා ම ව්‍යාපාරවලට පක්ෂපාතී බවට

ප්‍රකට ය. ඊට වඩා යහපත් කන්ඩායමක් ගැන පරිකල්පනය කල නොහැක."

*වෝල් ස්ට්‍රීට් ජර්නල්* පුවත්පත මෙසේ උදෙයා්ගයෙන් ප්‍රකාශ කලේ යː "සිය පූර්වගාමිකයින් මෙන් වඩාත් තරුන නායකයෝ සියල්ල පක්ෂයට ගැති වූ සාමාජිකයන් වෙත්. ඔවුන් ප්‍රතිපත්තිවල මූලික වෙනස්කමක් යෝජනා කිරීමට ඇති ඉඩකඩ බොහෝ සෙයින් ම අඩු ය. සිය වේගයෙන් දියුනුවන ආර්ථිකයට සරිලන සේ චීනයේ දේශපාලනමය හා මූල්‍යමය පද්ධතීන් ශක්තිමත් කිරීම උදෙසි ක්‍රියාත්මක වන නායකත්වයකට නීතිය හා සමාජ විද්‍යා පිලිබඳ නව පරම්පරාවේ අත්දැකීම ගැලපේ. මෙය, මීට කලින් පරම්පරාවේ පසුබිම, වෙල්, පාලම් හා අනිකුත් යටිතල පහසුකම් ගොඩනැගීම තුලින් සිය යුගයේ පැලපදියම් වූ අදහස් පිලිබිඹු වූවා සේ ය."

## හූ ජින්ටාවෝගේ න්‍යාය'

සිය පූර්වගාමිකයින් මෙන් හූ ද මතවාදී වශයෙන් නවීකරනය කරන්නකු සේ පෙනී සිටීමට ත්සාහ දරයි. ඔහු "සංවර්ධනය පිලිබඳ දැක්ම" සම්බන්ධයෙන් සිය කැපවීම පක්ෂයේ ව්‍යවස්ථාව ට අන්තර්ගත කලේ ය. පාරිසරික වශයෙන් හිතකාමී ප්‍රතිපත්ති හා පොදු ජනතාව අරබයා සංකේතමය සමාජ වාසි ඇතුලත් "සුසංගත සමාජයක්" ගොඩනැගීමට සම්මේලනයෙහිදී සභාපති යලිත් පොරොන්දු විය. මේ සියල්ල හා කම්කරු පන්තියේ හෝ ගොවි ජනතාවගේ අවශ්‍යතා අතර සබැඳියාවක් නොමැත. ඒ වෙනුවට ඉන් ප්‍රකිශිත වන්නේ චීනය වඩාත් තාක්ෂනික වශයෙන් විදග්ධ ආර්ථික බලවතෙකු බවට පත් කිරීමට නව ධනේශ්වර ප්‍රභූවේ ඇතැම් කොටස්වල අභිලාෂයන් ය.

ෂැංහයි කොටස් වෙලඳපොල සීසීපීයේ සම්මේලනයේ ආරම්භයට උපහාර දැක්වූයේ පසුගිය සඳුදා මුල් වතාවට ඒකක 6,000 පසු කිරීමෙනි. 2002 වසරෙහි දී හූ බලයට පත්වන විට චීනයේ බිලියනයක වත්කමක් ඇති එකදු පුද්ගලයෙක් නොවී ය. සම්මේලනයට පෙරාතුව නිකුත් කරන ලද ධනය පිලිබඳ ලැයිස්තුව පෙන්නුම් කරන්නේ දැන් " කොමියුනිස්ට්" චීනයෙහි බිලියනයක වත්කමක් ඇති පුද්ගලයින් 106 දෙනෙක් සිටින බවය. මේ අතින් චීනය දෙවැනි වන්නේ බිලියනයක වත්කමක් ඇති 400 දෙනෙකුට අධික පිරිසක් සිටින එක්සත් ජනපදයට පමනි. පසුගිය වසර තුල චීනයෙහි පොහොසත් ම පුද්ගලයින් 40 දෙනා සිය වත්කම් තෙගුන කර ගෙන ඇත. දැන් මේ 40 දෙනා සතු වත්කම් එක්සත් ජනපද ඩොලර් බිලියන 120ක් වේ. ජ්‍යෙෂ්ට සීසීපී නායකයින්ගේ පුතුන් ද සුපිරි පොහොසත් ගනයට ඇතුලු වී ඇත.

සංඛ්‍යාලේඛන පෙලක් තුලින් විදහා දැක්වෙන්නේ හූ යටතේ ධනේශ්වර වර්ධනයේ වේගයයි. 2002 වසරේදී ඩොලර් බිලියන 286.4ක් වූ චීනයෙහි විදේශ මුදල් සංචිත මේ වසරේ අගෝස්තු මස වන විට ඩොලර් ට්‍රිලියන 1.41ක් තරම් උසකට නැංගේය. 2002 වසරේ දී ඩොලර් බිලියන 620.8ක් වූ චීනයෙහි විදේශ වෙලඳම 2006 වසර වන විට තෙගුනයකින් නගිමින් ඩොලර් ට්‍රිලියන 1.76ක් බවට පත් විය. එම කාල වකවානුව තුල රටෙහි ගල් අඟුරු පරිභෝජනය ටොන් බිලියන 1.37ක සිට ටොන් බිලියන 2.37ක් දක්වා වැඩිවුනු අතර බනිජ තෙල් පරිභෝජනය ටොන් මිලියන 247.8ක සිට ටොන් මිලියන 320ක් දක්වා නැංගේ ය. මෙම වර්ෂය අවසාන වන විට ජර්මනිය අභිබවා යමින් එක්සත් ජනපදයට හා ජපානයට පසු පසු චීනය ලොව තෙවැනි විශාලතම ආර්ථිකය බවට පත් වනු ඇතැයි ඇතැම් විශ්ලේෂකයෝ අනාවැකි පලකරත්.

වැදගත් කරුන වූයේ පැය දෙකහමාරක සිය ආරම්භක දේශනය තුල "කම්කරු පන්තිය" යන වදන හූ භාවිතා කලේ එක් වරක් පමනක් වීමයි. එනමුදු, ධනපති පන්තිය සිය අති විශාල ධනස්කන්ධය එක් රැස් කරන සැබෑ පදනම වන්නේ මෙම සමාජ බලවේගයෙහි සූරාකෑම ය. භූගෝලයීය නිෂ්පාදනයෙහි ප්‍රතිඵලයක් වශයෙන් චීන ජනගහනයෙන් අඩකට ආසන්න ප්‍රමානයක් (මිලියන 560ක්) දැන් දිවි ගෙවන්නේ නගරවල ය. මෙයට සාපේක්ෂව 1980 වසරේ නගරවල වාසය කලේ චීන ජනගහනයෙන් සියයට 20ක ප්‍රතිශතයක් පමනි. යටත් පිරිසෙයින් චීන කම්කරුවෝ මිලියන 109ක් නිෂ්පාදන කර්මාන්තයෙහි සේවය කරත්. මෙය රටවල් 7කින් සමන්විත කාර්මිකකරනය වූ රටවල කන්ඩායම තුල නිෂ්පාදන කර්මාන්තයෙහි නියැලි සංඛ්‍යාව (මිලියන 53ක්) මෙන් දෙගුනයකි. (අඩු වැටුප් ලබන ග්‍රාමීය සංක්‍රමික කම්කරුවන් මිලියන දස ගනන් අත් හල පසු) 2006 වසරේ චීනයේ කම්කරුවන්ගේ වැටුප් සාමාන්‍යය මසකට ඩොලර් 230කි. මෙය එක්සත් ජනපද කම්කරුවන් ලබන වැටුප් මට්ටමින් සියයට 7ක ප්‍රතිශතයක් පමනි. මේ අති විශාල ලාභ ශ්‍රම හමුදාව තීරනාත්මක වනුයේ චීන ආර්ථිකයේ මෙහෙයුම්වලට පමනක් නොව සමස්තයක් වසයෙන් භූගෝලීය ධනවාදයට ය.

සීසීපීයට ඇතුල්වීමේ දොරවල් පුද්ගලික ව්‍යාපාරිකයන්ට විවෘත කරමින් එය "නිර්ධන පන්තියේ" පක්ෂයක් ය යන පැරනි මුසාව 2002 වසරේ පවත්වන ලද අවසාන පක්ෂ සම්මේලනයෙහි දී ජියැං සෙමින් ඇත්ත වශයෙන් ම වලලා දැමී ය. සීසීපීය "චීන ජනතාවගේ" සහ "ජාතික පුනර්ජීවයේ" පක්ෂයක් ලෙස ප්‍රකාශ කිරීම තුලින් චීන සමාජයේ ගැඹුරුවෙමින් පවතින පන්තීන් අතර පරතරය සඟවාලීමට ජියැං හා

හූ උත්සාහ දරා ඇත. හූ හා ජියැං අතර උපායමාර්ගික වෙනස්කම් තිබුන ද, 1949 වසරේ විප්ලවයෙන් පසුව ඉවත්කරන ලදැයි කියනු ලබන චීනයෙහි ධනවාදී සූරා කෑමේ කුරිරු යථාර්ථයන් වසන් කිරීමෙහි ලා මේ දෙදෙනා අතිනතගත් සහෘදයෝ වෙති.

සීසීපීය චීනයේ ධනපති පන්ති පාලනයෙහි නග්න මෙවලමක් ය යන යථාව ජාත්‍යන්තර පුවත්පත් හොඳින් අවබෝධ කරගෙන ඇති අතර එය එක්තරා අන්දමක විහිලුවක් ලෙස සලකනු ලැබේ. ෆිනෑන්ෂල් ටයිම්ස් පුවත් පත මෙවන් සටහනක් තැබීය: "රාජ්‍ය ව්‍යාපාරවල මුඛ්‍ය වත්කම් පක්ෂය මගින් පාලනය කිරීම හා පුද්ගලික අංශය යටත්විජිතකරනයට ලක් කිරීමේ එහි උත්සාහයන් හේතු කොට ගෙන මෙම සංවිධානය 'ලොව විශාලතම පරිපාලන සමාගම' බවට පත් කොට ඇතැයි බීජිංහි පිහිටි ජාත්‍යන්තර සාමය සඳහා වූ කානගී ප්‍රදානයෙහි සීං සුවෙලියැං උපහාසාත්මකව කියා සිටී. එය දේශපාලන පක්ෂයකට වඩා වානිජ්‍ය මන්ඩලයකට සමාන වන බවට වෙනත් අය විහිලු ස්වරයෙන් පවසත්"

බ්‍රිතාන්‍යයෙහි පලකරන ඉන්ඩිපෙන්ඩන්ට් පුවත්පත සම්මේලනයෙහි නියෝජිත චෙන් අයිලියන්ගේ නිදසුනට අවධානය යොමු කලේ ය. 49 වැනි වියෙහි පසුවන ඇය ආසියාවෙහි විශාලතම ඇලුමිනියම් මිශ්‍ර ලෝහ රෝද නිපදවන්නා වන වැන්ෆෙන් ඔටෝ පරිපාලන සමාගමේ සභාපතිනියයි. ඇය රෝල්ස් රොයිස් මෝටර් රථයක් පදවයි සරුසාර සෙජියැං ප්‍රදේශයෙහි "කොමියුනිස්ට්" පුද්ගලික හිමිකරුවන් ඇය නියෝජනය කරයි.ඇය සීසීපීයට බැඳුනේ 1985 වසරේදී ය. ඇගේ සමාගමෙහි දැන් පක්ෂ ශාඛාවක් ඇත. "පසු ගිය වසර තුල ධනපතීන් 1554 දෙනෙක් පක්ෂයට බැඳුනි. මේ සංඛ්‍යාව කුඩා වුව ද ඔවුන් ඇති කරන බලපෑම අතින් බලන කල සැලකිය යුතු ගනනකි. කොටස් වෙලඳපොලේ නැග්ම හා වසර කිහිපයක් තුල අත්කරගත් ඉලක්කම් දෙකේ ආර්ථික වර්ධනය හේතු කොට ගෙන නව ව්‍යවසායක පන්තියක් බිහි වී ඇත. චීනයෙහි ඩොලර් මිලියනයක වත්කම් ඇති පුද්ගලයින් 345,000 දෙනා පක්ෂය තුලට පිලිගැනෙන්නේ ඉතාමත් ඕනෑකමකිනි"යි ඉන්ඩිපෙන්ඩන්ට් පුවත්පත ලිවී ය.

"ප්‍රජාතන්ත්‍රික ප්‍රතිසංස්කරන", "නීතියේ ආධිපත්‍යය හා රාජ්‍ය නිලධාරි තන්ත්‍රය සුමට හැඩගැන්වීමකට ලක් කිරීම යන කරුනු පිලිබඳ හූගේ ආරූඪ කරගත් කැපවීම පසු පස ඇති සමාජ බලවේග වනුයේ වෙලඳපොලේ මෙහෙයුම, පුද්ගලික ව්‍යවසායන්ගේ ධනය හා ප්‍රධාන නගරවල නැගී එන මධ්‍යම පන්තියයි. එක් පක්ෂයකට පමනක් සීමාවුනු චීන රජය තව දුරටත් තනි සංවිධානයක් නොවේ. මධ්‍යම හා ප්‍රාදේශීය ආන්ඩු අතර තරගවදින අවශ්‍යතාවයන්ගෙන් ද තරගවදින ආර්ථික අංශයන්ගෙන් හා පුද්ගලික සංස්ථාවන්ගෙන් ද එය සමන්විත වේ. ඒ සමග ම ගැඹුරු සමාජ බෙදීම් යටපත් කිරීම, කම්කරුවන් හීෂනයට ලක් කිරීම හා ධනේශ්වර ආර්ථිකය ගොඩනැගීමට රාජ්‍ය සහාය සැපයීම සඳහාත් පාලක ප්‍රභූව ආධිපත්‍යයික පාලනය මත වැඩි වැඩියෙන් යැපේ.

"සුසංගත සමාජයක්" ගොඩනැගීමේ හූගේ සටන්පාඨය පැන නගිනුයේ මේ තරග වදින ඉල්ලීම් සියල්ල හසුරුවා ලීමට උත්සාහ දැරීමේ වඩ වඩාත් අපහසුවන කාර්ය භාරය තුලිනි. බලශක්තිය සහ ස්වාභාවික සම්පත් පරිභෝජනය අඩු කිරීම සඳහා " තුලනාත්මක" වර්ධනයකට පක්ෂව ඔහු කථා කරයි. 1990 ගනන්වල මුල් භාගයේ සිට ශ්‍රමය මත බර තබන හා බලශක්තිය මත බර තබන කර්මාන්තවල දැවැන්ත ව්‍යාප්තිය හේතු කොට ගෙන චීනයේ බලශක්ති සැපයුම තම සීමාවන් කරා ගෙන ගොස් වර්ධනය වන පාරිසරික ගැටලු නිර්මානය කොට ඇත. නව අවධාරනය තාක්ෂනික නවීකරය හා දේශීය පරිභෝජනය මත වේ. චීනයේ විශාලතම නිර්යාත වෙලඳපොලවල් වන එක්සත් ජනපදයෙහි හා යුරෝපයෙහි මන්දාවධමනය පිලිබඳව වර්දනය වන බිය හා මෙය එකට වෙලී ඇත.

ආර්ථික වර්ධනයෙහි ජයග්‍රාහකයින් වශයෙන් තාක්ෂනික වශයෙන් වඩාත් දියුනු වූ ව්‍යවසායකයින් බීජිං නගරය ප්‍රවර්ධනය කරයි. එය පාරිසරික හානිය නවතාලීමට හෝ සමාජ අසමානතා ආපසු හැරවීමට තුඩු දෙන කිසිවක් නොකරන අලෙවිකරන මූලෝපායකි. හූගේ "හරිත" ප්‍රතිපත්තියට පින්සිදුවන්නට මෙම වසරේ ඉහල ම තලයේ වැජඹෙන බිලියනයක වත්කම් ඇති චීන ජාතිකයින් 40 දෙනාගේ ෆෝබ්ස් ලැයිස්තුවට සූර්ය ශක්ති සංගත දෙකක අයිතිකරුවන් ද ඇතුලුවිය. මේ අතර වාරයේ චීනයේ සරුවට වැඩෙන්නා වූ එහෙත් අරාජික වූ කාර්මික නිෂ්පාදනයට යටින් වල කැපෙනු ඇතැයි යන බියෙන් හරිතාගාර වායු කපා දැමීමට ස්ථිර කැපවීමක් කිරීම බීජිං නගරය ප්‍රතික්ෂේප කර ඇත.

"සැමට මූලික ජීවන තත්වයන් සහතික කෙරෙන පරිදි" මූලික සමාජ ආරක්ෂක පද්ධතියක් ඇති කිරීමට ද හූ ප්‍රතිඥා දුනි. 'මධ්‍යම ගනයේ ආදායම් ඇති' නිවැසියන් අනාගතයේ දී ජනගහනයෙන් බහුතරය වනු ඇතැයි පවා ඔහු ප්‍රකාශ කර සිටියි. එනමුදු චීනයෙහි පොදු ජනතාව මුහුන දෙන දැවෙන ප්‍රශ්න වන ඔරොත්තු නොදෙන නිවාස ප්‍රශ්නය, ශීලාචාර රැකියා නොමැතිකම, ග්‍රාමීය දරිද්‍රතාවය හා මිල අධික සෞඛ්‍ය ආරක්ෂනය යන්න විසඳලීමට කිසිදු වැදගත් පියවරක් චීන ජනාධිපති නිවේදනය කලේ නැත.

රටෙහි බිලියන 1.3ක ජනකායගෙන් බොහොමයකට බලපාන මේ දැවැන්ත ගැටලුවලට විසඳුම ආන්ඩුව මගින් මුදලින් කොටසක් සැපයෙන

සීමිත සමාජ රක්ෂන වැඩපිලිවෙල් නොවේ. බිලියනයක හා මිලියනයක වත්කම් ඇති පුද්ගලයන් සතු සමාජ ධනය වැඩ කරන ජනතාවට මූලික වශයෙන් යලි බෙදා හැරීමකට අඩු යමක් එයට නොසෑහේ. හූගේ සුසංගත සමාජයෙන් උදක්ම ප්‍රකාශිත වන්නේ පොහොසතුන් හා දුප්පතුන් අතර පුලුල්වන දැඩි පරතරය වැඩි වන සමාජ අස්ථායිතාව ට හා දේශපාලන කැලඹීමට මං පාදනු ඇතැයි යන පාලක ප්‍රභූව තුල ඇති බියයි.

ඉදිරියේදී ඇතිවන අනතුරුවලට *ෆිනෑන්ෂල් ටයිම්ස්* පුවත්පත ඉඟිකලේ යඃ "සාර්ව ආර්ථික අසංතුලන" එනම්, අධික ආයෝජන හා පිම්බෙන විදේශ අතිරික්තයන් දිගටම පවතී. පාරිසරික අවක්‍රමනය තව දුරටත් පවතී. ආදායම් අසමානතා පුලුල් වෙමින් පවතී." වර්තමාන සමපේක්ෂනය ආයෝජන බුබුලුවල කඩා වැටීමේ ප්‍රතිඵලය වනුයේ ආර්ථික අර්බුද හා සමාජ කැලඹිලිය. "හූ මහතාට යහපත්ම ප්‍රතිඵලය අත් වනුයේ 17 වැනි සම්මේලනයෙහි දී පූර්න වශයෙන් සිය ආධිපත්‍ය ස්ථාපිත කිරීමෙහි දී සාර්ථක වීමත් දේශපාලන ජාල හිරවුම කඩා බිඳ දැමීමත් දිගු කලක් පමාවුනු ප්‍රතිසංස්කරන නොබියව ඉදිරියට ගෙන යෑමත් තුලිනි. ඔහුට තෝරා ගැනීමට අන් යමක් නොමැත. සම්මේලනය, කුනාටුවට පෙරාතුව අවසන් හමුවීම වීමට කිසිදු චීන නායකයෙක් කැමති නැතැ"යි *ෆිනෑන්ෂල් ටයිම්ස්* පුවත් පත ලිවීය.

සීසීපීයේ සම්මේලන ස්ථාවරත්වයෙහි ආර්ථික වර්ධනයෙහි හා ලාභ ලැබීමෙහි සහතිකයක් ලෙස ඉදිරිපත් කිරීමට උත්සාහයන් සියල්ල දැරුව ද, ඊනියා ආර්ථික ප්‍රාතිහාර්යය ඉක්මනින් කඩා වැටීමට ඉඩ ඇති බවට චීනයෙහි පාලක කවයන් තුල හා ජාත්‍යන්තර වශයෙන් තියුනු අවබෝධයක් ඇත.

© www.wsws.org